ඇමරිකානු තානාපති කාර්යාලය
GARDENER CUM SWIMMING POOL ATTENDANT
(උද්‍යානකරු සහ පිහිණුම්තටාක සහයක ඇබෑර්තුව)

ඔබට ආයතනයක උද්‍යාන නඩත්තු කිරීම පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් සහ පිහිණුම් තටාක නඩත්තුව පිළිබඳව මාස හයක පළපුරුද්දක් තිබේද? එමෙන්ම, එම කාර්යයන් පිළිබඳ මනා දැනුමක් මෙන්ම, ඒ සම්බන්ද අත්මෙවළුම් සහ යන්ත්‍ර පිළිබඳව දැනුමක් සහිතව, ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අවම වශයෙන් සාමාන්‍ය දැනුමක් තිබේද? එසේම, ඔබට පිහිනීමේ කුසලතාවය තිබේද? (ඉංග්‍රීසි දැනුම සහ පිහිනීමේ කුසලතාවය පරීක්ෂා කරනු ලැබේ) තවද ඔබ පහත සදහන් සුදුසුකම්ද සපුරන්නේද?

එසේනම්, පහත සදහන් කරුණු ඇතුළත්ව සකසන ලද මුල් පිටුවක් සමගින් ඔබගේ සවිස්තරාත්මක අයදුම්පත අප වෙත යොමු කරන්න.
(හැකිනම් අධ්‍යාපන සහ සේවා සහතික පිටපත්ද අමුණා එවන්න)

අයදුම් පතේ මුල් පිටුව:

1. අයදුම් කරන තනතුර 2. අයදුම්කරුගේ සම්පූර්ණ නම 3. වර්තමාන ලිපිනය 4. දුරකථන අංකය

5. ජාතික හැඳුනුම්පත් අංකය 6. ඔබ වයස අවුරුදු 18-60 අතරද? (ඔව්/නැත) 7. ඔබ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියෙහිද? (ඔව්/නැත."ඔව්" නම්, ප්‍රතිඵල) 8. ඔබට ආයතනයක උද්‍යානකරුවකු ලෙස වසරක සේවා පළපුරුද්දක් තිබේද? (ඔව්/නැත."ඔව්" නම්,ආයතනයේ නම, තනතුර, සේවා කාලය - අවු /මාස) 9. ඔබට පිහිණුම්තටාක සහයක ලෙස මාස හයක (6) පළපුරුද්දක් තිබේද? (ඔව්/නැත."ඔව්" නම්,ආයතනයේ නම, තනතුර, සේවා කාලය - අවු /මාස) 10. වලංගු "B" (පෙර C, C1) කාණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ඔබ සතුද? (ඔව්/නැත. "ඔව්" නම්,රියදුරු බලපත්‍ර අංකය) 11. ඔබගේ වර්තමාන මාසික වැටුප?

දින හතරහමාරක (4 1/2) වැඩ සතියක් සමග ඔබගේ සේවය සඳහා පිරිනමන මාසික ආරම්භක වැටුප රු.28,400/= කි.

මුල් පිටුව පමණක් හෝ මුල් පිටුව අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි බව කරුණාවෙන් සළකන්න. තවද, සේවයට බඳවාගන්නා අවස්ථාවේදී සියලුම සහතික පත් සහ ලේඛණයන්හි නිරවද්‍යතාවය විධිමත්ව පරීක්ෂා කරණු ලැබේ.

ඔබගේ සම්පූර්ණ අයදුම්පත තැ.පෙ. 106, කොළඹ යන ලිපිනයට හෝ ColomboHR@state.gov යන විද්‍යුත් තැපෑලට 2011 සැප්තැම්බර් මස 14 වන දිනට පෙර එවිය යුතුය. ලියුම් කවරය ඉහළ වම් කෙළවර හෝ විද්‍යුත් තැපෑලෙන් එවන්නේ නම් එහි **Subject Line** හි ඔබ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

- ✓ මෙම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් මත සලකා නොබැලේ.
- ✓ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට පමණක් ප්‍රතිචාර ලිපි/දුරකථන ඇමතුම් ලැබෙනු ඇත.

ඔබට අප පිළිබඳව තවදුරටත් දැනගැනීමට අවශ්‍ය නම්, **http://srilanka.usembassy.gov/** වෙබ් අඩවියෙන් වැඩි විස්තර ලබා ගත හැක.

The U.S. Embassy is an Equal Opportunity Employer.